The Faculty Journal of Humanities and Social Sciences, Volume 08, Issue 02, December 2019

# පුරාතන ලංකාවේ රාජ්‍ය පාලනය තුළින් නිරූපිත යහපාලන ලක්ෂණ

**කංචන ජනප්‍රිය**

ඉතිහාස අධ්‍යයන අංශය
රුහුණ විශ්වවිද්‍යාලය

---

**සංක්ෂේපය**

*ශ්‍රී ලංකාවේ පැරණි රාජධානි සමය රාජාණ්ඩු පාලනයක් හා කේන්ද්‍රගත වූ බලයක් සහිත පාලන රටාවකින් සකස් වූ බව මූලාශ්‍රය සාක්ෂි අනුව පැහැදිලි වේ. අතීතයේ දී මෙරට පාලන ක්‍රමය සකස්ව පැවති දේශපාලන රටාව පිළිබඳ ව අධ්‍යයනයේ දී එම පාලන ක්‍රමය ඒකාධිපති ස්වරූපයක් ගත් වග හඳුනා ගැනීමට නො හැකි වේ. ශ්‍රී ලංකාවේ පාලකයින් චිරාත් කාලයක සිට රාජ ධර්ම, පෙර රජවරුන්ගේ චාරිත්‍ර, රජ සිරිත් විරිත් හා බෞද්ධාගම මඟින් පාලනයට ලක් වූ බව මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි කර ගැනීමට හැකි විය. ඒ හේතුවෙන් රජුගේ පෞද්ගලික චරිතය සකස්ව ඇත්තේ ඒකාධිපතියෙකු ලෙස නොව, ''මනුජාධිප'' ලෙස වංශ කථාවේ දැක්වෙන පරිදි ''මනුෂ්‍ය ප්‍රජාවේ නායක'' යන පදනම ඇතිව ය. එහෙයින් මහජනතාවට හිතකර පාලන රටාවක නිරත වීමට මෙරට පාලකයින් උනන්දු විය. රජ තනතුරට පත් වූ පුද්ගලයා රටේ යුක්ති ධර්මයේ උල්පත ලෙස ද, චරිතයෙන් උත්කෘෂ්ට ද හා දේවත්වයේ පිළිබිඹුවක් ලෙස ද මෙරට ජනයා සැලකූහ. ඒ අනුව රජුට මහජන සුභසාධනයේ යෙදීමට අදාළ තනතුරේ පැවති පාරම්පරික රාජ ධර්ම බලපාන ලදි. එහෙයින් රජුගේ පාලනය නීතිය හා ධර්මය අබිබවා යෑමට නො හැකි විය. රජුගේ චරිතය ස්වභාවයෙන් ම මහජන යහපත පැතීම හා ඒ සඳහා කටයුතු කිරීම වූ බැවින් මෙරට රජවරුන්ගේ පාලන තන්ත්‍රය ''යහපාලන ලක්ෂණ'' වලින් යුක්ත විය. අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනය සඳහා පැවති ප්‍රාදේශීය පාලන රටාවෙන් ද පෙන්නුම් කෙරෙන්නේ මහජනතාවට තම ගැටලු විසඳා ගැනීම සඳහා පරිපාලන බලය විමධ්‍යගත කරන ලද නිලධාරී මණ්ඩලයකින් යුක්ත වූ බවකි. නිලධාරීන්ගේ බලය ඉහළ නිලධාරීන් අතින් සුපරීක්ෂණයට ලක් වූ අතර සියලු නිලධාරින් රජුගේ අධීක්ෂණයට ලක්වෙන ක්‍රමවේදයක් ද පැවතිණි. ඒ අනුව ජනතාවගේ ගැටලු සඳහා ප්‍රජාතාන්ත්‍රික හා සාධාරණ විසඳුම් ලබා දෙන ක්‍රමවේදයක් යටතේ අතීත යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා තිබූ බව හඳුනාගත හැකි විය. මූලාශ්‍රයගත දත්ත පුස්තකාල අධ්‍යයනය යටතේ හඳුනාගෙන ඒවායේ අන්තර්ගතයන් විශ්ලේෂණය මඟින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. ඒ මඟින් අතීත ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන රටාව තුළ යහපාලන ලක්ෂණ ප්‍රකට වූ බව හඳුනා ගත හැකි විය.*

**ප්‍රමුඛ පදඃ** *රජු, රාජ්‍ය පාලනය, යහ පාලනය, පරිපාලන ධූරාවලිය, මහජන සුභ සාධනය*

## 1. හැඳින්වීම

අනුරාධපුර රාජ්‍ය පරිපාලන සංවිධාන රටාව හා බැඳුණු යහපාලන ප්‍රතිපත්ති පිළිබඳව මෙම ලිපියෙන් අධ්‍යයනය කිරීම සිදු වේ. ජන නායකයකු වශයෙන් රජුට හිමි වන වැදගත්කම, ඔහුගේ පාලන ක්‍රමයන්, රජුගේ රාජ්‍ය නිපුණත්වය හා ආර්ථික, දේශපාලනික, ආගමික, සමාජීය, සංස්කෘතිමය ක්ෂේත්‍රවල දී රජුගේ කාර්යය සහ නිලධාරී මණ්ඩලය පිළිබඳව ද මෙහි දී කරුණු පුළුල්ව විමර්ශනයට ලක් කෙරේ. රාජ්‍යය පාලනය යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා ක්‍රමිකව සංවිධායන කළ පරිපාලන රටාව හා ඒ හා බැඳුණු යහපාලන ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම ද මෙහි දී සිදු වේ.

රජ තනතුර හෙවත් රාජ්‍යයත්වය පිළිබඳ මූලිකව ම කරුණු සාකච්ඡා කරනු ලබන අතර අනුරාධපුර යුගයේ පැවති රාජ්‍ය පරිපාලන ව්‍යුහය සකස්ව තිබුණු ආකාරය ද අධ්‍යයනයට ලක් කෙරේ. එහි දී නිලධාරීන්, අධිකරණය සහ ප්‍රාදේශීය පාලනය රජවරුන්ට රාජ්‍යය පාලනය විචාරීමේ දී මහෝපකාරී වූ ආකාරය ද විමසීමට ලක් කරනු ලැබේ. ශක්තිමත් රාජ්‍යය පරිපාලන ව්‍යුහයක් මගින් යහපත් රාජ්‍යයක් පවත්වාගෙන යෑම පහසු වන අතර එය රාජ්‍යයේ අඛණ්ඩත්වය ගොඩ නැගීම සඳහා ස්ථිර පදනමක් බවට ද පත්වේ.

වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුළ යහ පාලනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව කතිකාවතක් ගොඩ නැගී ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයෙකු වූ ඒබ්‍රහම් ලින්කන්ට අනුව ප්‍රජාතන්ත්‍රවාදය යනු මිනිසා විසින් මිනිසාගේ යහපත උදෙසා පිහිටුවාගෙන තිබෙන මිනිසාගේ ම පාලන ක්‍රමයක් ලෙස අර්ථ දක්වා ඇත. ඉන් ගම්‍ය වන ආකාරයට බහුතර ජනතා කැමැත්ත මත පවත්වන ප්‍රජාතන්ත්‍රවාදී රජයක අරමුණ විය යුත්තේ මහජනතාවගේ ජීවිත සුරක්ෂිත කරමින් සුභ සාධන පාලන ක්‍රමයක් ගෙන යායුතු බව යි. එවන් පාලන ක්‍රමයක් අතීත ශ්‍රී ලංකාවේ අනුරාධපුර රාජධානී සමයේ දී රාජාණ්ඩුව තුළින් ද විද්‍යමාන වූ බව මූලාශ්‍රයගත තොරතුරු මඟින් ප්‍රත්‍යක්ෂ වේ.

පෙරදිග රාජ්‍යයන්හි ''රජු'' දෙවි කෙනෙකු බවට සාමාන්‍යයෙන් ජනතාව විසින් පිළිගන්නා ලදී. වංශකථාවලින් මෙන් ම සෙල්ලිපිවලින් ද ලබාගත හැකි තොරතුරු ඇසුරින් රජකම හෙවත් රාජ්‍යත්වය පැරණි ලංකාවේ වැදගත් ම දේශපාලන සංස්ථාව වූ බව ඉතා පැහැදිලි ය. මෙසේ රාජ්‍යය පාලනය යහපත්ව පවත්වාගෙන යෑමට බලපාන ලද කරුණු රැසක් පවතින අතර ඒ කෙරෙහි ඉවහල් වන සාධක කිහිපයක් වේ. ඒ සඳහා ප්‍රධාන වශයෙන් රජුගේ චරිත ස්වභාවය වැදගත් වන අතර එම චරිත ස්වභාවය මත අනෙකුත් සෑම ක්‍රියාකාරකමක් ම බැඳී පවතී. රටක ජනතාවට නිදහසේ ජීවත්වීමට එම රට විදේශ ආක්‍රමණවලින් ද රාජ්‍ය විරෝධී කැරලිවලින් ද ස්වාභාවික උවදුරුවලින් ද තොර විය යුතු ය. රජු යහපත් ආර්ථිකයක් ගොඩ නගමින් රාජ්‍යය පාලනය කළ යුතු වේ. මුල සිට රාජ්‍යත්වය සඳහා ලැබූ පුහුණුව ද සමාජ පරිසරය මඟින් මෙහෙය වූ හැඩගැස්ම ද සංඝයා වහන්සේලාගේ උපදෙස් පිළිපැදිය යුතු බවට රජ පවුලේ සෑම සාමාජිකයෙකුම තුළ ගොඩනගා තිබූ විශ්වාසය හේතු කොට ගෙන ද ක්‍රියාත්මක වශයෙන් රජුගේ බලය සීමා කෙරිණි. ඉපැරණි සිරිත් විරිත් නොසලකා හැරියා වූ ද, නැතහොත් සංඝයා වහන්සේලාගේ සිත් රිදවූවා වූ ද රජවරුන්ට ජනතාවගේ අනුකම්පාව නොලැබුණු බවට මූලාශ්‍රය මඟින් හෙළිවේ. රජුට ස්වකීය කැමැත්ත ක්‍රියාත්මක කිරීමට සිදු වූයේ රජයේ උසස් නිලධාරීන්ගේ මඟ පෙන්වීම යටතේ ය. රාජ්‍යයේ සුභසාධනයට බලපෑ වැදගත් කරුණු සම්බන්ධයෙන් එම නිලධාරීන් මණ්ඩලයක් වශයෙන් නිරන්තරයෙන් ම රජුට අනුග්‍රහය ලබා දුන් බව මූලාශ්‍රයවල දැක්වේ. එසේ ම රටේ රජතුමා යුක්ති ධර්මයේ උල්පත බව අතීත මහජනතාවගේ පිළිගැනීම විය.

බෞද්ධාගමික බලපෑම් නිසා ලංකාවේ රජවරුන් දශරාජ ධර්ම අනුගමනය කරමින් ජනතාව පාලනය කළ යුතු යැයි පැවති විශ්වාස ද, රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ ව අග්ගඤ්ඤ සූත්‍රය වැනි බෞද්ධ ඉගැන්වීම්වල එන අදහස් ද ලංකාවේ රාජ්‍යය පාලන කටයුතු පිළිබඳව වෙන වෙන ම න්‍යාය ග්‍රන්ථ බිහි නොවීමට හේතු වූවා යැයි උපකල්පනය කළ හැකි ය.

## 2. අධ්‍යයනයේ වැදගත්කම හා අරමුණු

ශ්‍රී ලංකාවේ පැරණි රාජ්‍ය පාලනයේ දී රජවරුන් විසින් භාවිත කර ඇති දේශපාලන උපාය මාර්ග, ප්‍රතිපත්ති, නීති හා සම්ප්‍රදායන් පිළිබඳව මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු විය. ඒ අනුව අතීත ලංකාවේ රාජ්‍ය පාලනයෙන් විද්‍යමාන වන යහපාලන ලක්ෂණ හඳුනාගැනීමට උත්සාහ දැරීම මෙම අධ්‍යයනයේ මූලික වැදගත්කම ලෙස දැක්විය හැකි ය. නූතන ප්‍රජාතන්ත්‍රවාදය තුළ සාකච්ඡාවට ලක්වන මාතෘකාවක් වශයෙන් යහපාලනය, අතීත ශ්‍රී ලංකාවේ කෙසේ භාවිත වී ඇත් ද? යන්න සහ මෙරට පාලකයින්ගේ ප්‍රතිපත්ති හා ඒවා මහජන සුභසාධනයට මෙන් ම සාධාරණ පාලනයකට හේතු වූ අන්දම හඳුනා ගැනීම ද සිදු විය. ඒ අනුව මේ අධ්‍යයනයේ දී මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂා කළ අරමුණු පහත දැක්වේ.

අ. ශ්‍රී ලංකාවේ අතීත රාජ්‍ය පාලන රටාව හා රජුගේ චරිත ස්වභාවයේ ගැබ්ව පැවති මහජනතාව පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම

ආ. අතීතයේ භාවිත කරන ලද ප්‍රාදේශීය පරිපාලන රටාව හා නිලධාරී මණ්ඩලවල පාලනය මහජනතාවට හිතකර වී ද? යන්න විමර්ශනය කිරීම

ඇ. රජුගේ පාලන ප්‍රතිපත්තිවල අන්තර්ගතව ඇති මහජන සුභසාධනය හා යහපාලන ප්‍රතිපත්තිවල ස්වභාවය අධ්‍යයනය කිරීම

ඈ. ශ්‍රී ලංකාවේ පාලන රටාව තුළ දක්නට ලැබුණු යහපාලන ලක්ෂණ අධ්‍යයනය කිරීම

## 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන අධ්‍යයන ක්‍රමවේදය බවට පත්වූයේ පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය යි. එහි දී අපගේ අවධානය ප්‍රාථමික, ද්විතීයික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වෙත යොමු කරන ලද අතර හඳුනාගන්නා ලද ගුණාත්මක දත්ත අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ විවරණය කරන ලදී. සම වර්ගීය දත්ත විග්‍රහ කරමින් ඒ ඔස්සේ ලිපිය කොටස්වලට බෙදා තොරතුරු ඉදිරිපත් කොට යහපාලන ප්‍රතිපත්ති ඉස්මතු කර ඇත. හඳුනාගත් තොරතුරු නිරීක්ෂණය කරමින් අවසානයේ නිගමනවලට එළඹීම සඳහා සමාජවිද්‍යා පර්යේෂණවල භාවිත කරනු ලබන විද්‍යාත්මක ක්‍රමවේදය අනුගමනය කරන ලදි.

ඒ අනුව සමාජයේ පැවති මානව අත්දැකීම් හා භාවිතයන්ගේ ස්වභාවය හඳුනාගැනීමට උචිත මෙම පර්යේෂණ ක්‍රමවේදය ''යහපාලනය'' පිළිබඳ අතීත ලාංකේය භාවිතය හඳුනා ගැනීමට උපකාරී විය.

## 4. විමර්ශනය

### 4.1 රජ තනතුරු හා බැඳුණු යහපාලනය

ඕනෑම ශිෂ්ටාචාරයක ''රජ තනතුර'' සමාජයේ ප්‍රමුඛතම තනතුර වන අතර සමාජය ආරක්ෂා කිරීමේ වගකිම ඒ මතට පැවරී ඇත. පුරාතන අවධියේ සිට ම පාලන සංවිධානය මානව සමාජයේ ආරක්ෂාව තහවුරු කිරිමට හා සාමය ස්ථාපිත කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කර තිබේ. ප්‍රාථමික සමාජ අවධියේ දී පාරසරික වශයෙන් මෙන් ම අනෙකුත් මානව කතණ්ඩායම් වෙතින් එල්ල වන තර්ජනයන්ගෙන් ආරක්ෂා වීම හා ඊට ප්‍රතිප්‍රහාර එල්ල කිරිම ප්‍රධාන අවශ්‍යතාවක් ලෙසින් පැවතිණි. මේ තත්ත්වය යටතේ සමාජයෙන් ම තෝරාගත් කාය ශක්තියෙන් හෙබි පුද්ගලයෙකු වටා තම ආරක්ෂාව පතා ජනතාව පෙළ ගැසිණි. ප්‍රාථමික සමාජ අවස්ථාවේ ප්‍රධාන අවශ්‍යතාවක් ලෙස පැවති සමාජ ආරක්ෂාව පුරාතන ශ්‍රී ලංකාවේ පූර්ව රාජ්‍යය අවධියේ මෙන් ම රාජ්‍යයක් බිහි වීමෙන් පසු ද ප්‍රධාන අවශ්‍යතාවක් ලෙසින් දිගටම පැවති බව සාක්ෂි තිබේ. මෙසේ ක්‍රමිකව විකාශනය වී පුළුල් සංස්ථාවක් බවට පරිවර්තනය වූ රාජ්‍යයත්වයේ ප්‍රභවය පිළිබඳව බෞද්ධ, හින්දු සභ්‍යත්වවල දී දාර්ශනික අදහස් රැසක් ගැබ් කොට දක්වා ඇත.

පූර්ව රාජ්‍යය අවධියේ සිට ම ශ්‍රී ලංකාවේ පාලක පිරිස් ''ගාමිණී'' හා ''අභය'' යන විරුදය භාවිත කිරීමේ එක් අරුතක් ලෙසින් ඔවුන්ගේ යුද නායකත්වය හෙළිදරව් වන බව හෙට්ටිආරච්චි පෙන්වා දේ (Hettiarachchi, 1972:8-21). මුල් ජනාවාසවල රණවිරු අධිපතියෙකුගේ තත්ත්වයේ සිට ක්‍රමයෙන් විකාශනය වී රාජ්‍යයත්වයට පත්ව එය බෙහෝ දුරට වර්ධනය වීමෙන් පසුව වුව ද මුල දී මූලික වශයෙන් සංග්‍රාමික සංවිධානයක තත්ත්වය පිළිබිඹු කළ ගාමිණී යන පදය තවදුරටත් රාජකීය විරුදයක් ලෙස යොදාගනු ලැබ ඇත්තේ රජු යුද සෙන්පතියෙක් යන සංකල්පය රාජධුරයට කීර්තියක් එක් කළ නිසා බව හඳුනාගත හැකි ය. දේවානම්පියතිස්ස රජුගේ අභිෂේක මංගල්‍යය ප්‍රාදේශීය යුද්ධාධිපතියෙකුගේ තත්ත්වයේ සිට රාජ්‍යයත්වයේ සකලාංගයන්ගෙන් සමන්විත පිරිපුන් රජෙකුගේ තත්ත්වය දක්වා විකාශනය වීමේ අවස්ථාව හා සම්බන්ධ ඉතාම වැදගත් සන්ධිස්ථානය බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය කවදා කෙසේ සිදු වී දැයි ස්ථිර ලෙසින් ම කිව නොහැකි ය. වංශකථා තොරතුරු අනුව ඉන්දියාව හා පැවති සම්බන්ධතා නිසා ශ්‍රී ලංකාවේ රාජ්‍යයත්වය ඇති වූ බව කියවේ. දේවානම්පියතිස්ස යුගයේ දී අශෝක රජු හා පැවති මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස අභිෂේක ප්‍රදානය කිරීමෙන් රාජ්‍යයත්වය තහවුරු වූ බව වංශකථාවන්හි සඳහන් වේ (ඤාණවිමල, 1959: 11 පරි, 39-40 ගාථා; බුද්ධදත්ත, 1996: 11 පරි, 36, 40, 41 ගාථා).

වංශකථා සාහිත්‍ය මෙන් ම ශිලා ලේඛන මූලාශ්‍රයයන්හි සඳහන් වන අන්දමට රජුට පැවරුන ප්‍රධාන කාර්යය වූයේ ලෝ සසුන් වැඩමවීම හෙවත් මහජනයා සහ බු≥දහම ආරක්ෂා කිරීම යි. පැරණි නීතිරීති සහ සංස්ථාවන් නොකඩවා පවත්වාගෙන යාමත්, කායික මානසික වශයෙන් දුර්වල පුද්ගලයන් ආරක්ෂා කිරීමත් රජුගේ යුතුකම් ලෙස සලකනු ලැබූ බව මෙයින් පෙනෙයි. ජනතා සුභවාදී යහපාලන මූලධර්ම ඉටු කිරීම රජෙකුගේ වගකීමක් ලෙස සැලකිණි. රට බාහිර පරසතුරන්ගෙන් ආරක්ෂා කරමින් අභ්‍යන්තර කැරලි, කෝලාහල, දුර්භික්ෂ, ලෙඩරෝග, වසංගත හා සතුරන්ගෙන් වන හානි වළක්වා ඒවායින් මහජනයා ආරක්ෂා කර ගැනීම සඳහා රජවරුන් විසින් නිසි පියවර ගන්නා ලදී. එමෙන් ම කෘෂිකර්මාන්තය නගාසිටුවීම සඳහා අවශ්‍ය ජල පහසුකම් සැපයීමට වාරිකර්මාන්ත

ඉදිකිරීමත් රජුගේ කාර්යභාරය විය. ඒ අනුව නියම කලට වැසි ලැබෙන බවත්, අස්වැන්න වැඩිවන බවත්, මහපොළව ගොවියාට එලදාව ලබාදෙන බවත් පාලකයින් විසින් කල්පනා කර කටයුතු කරන ලදි. ලෙඩරෝග හා වසංගත පිටුදැකීම පිණිස මිනිසුන් සඳහා මෙන් ම තිරිසන් සතුන් සඳහා ද රෝහල් ඉදිකොට ඒවා පවත්වාගෙන යාමට කටයුතු කරන ලදි. ශාසනය ආරක්ෂා කර ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට සිවුපසය හා වෙනත් දෑ සැපයු අතර ආගමික ගොඩනැගිලි ආදිය නඩත්තු කිරීම ද රජුගේ කාර්යයන් අතර විය. තව ද භික්ෂූන් වහන්සේලාගේ අනුමැතියෙන් ධම්ම කම්ම හා කතිකාවත් පවත්වා ශාසනය පවිත්‍ර කළ බව ද සඳහන් වේ (බුද්ධදත්ත, 1996).

පසුකාලීනව ලක්දිව රජුන් දෙවියන් වශයෙන් නොගැනුන ද ඔවුන් තවදුරටත් හුදු මිනිසුන් වශයෙන් නොසැලකිණි. වට්ටගාමිණී අභය රජු ''පිතිරාජ'' විරුදනාමය භාවිත කරන ලද්දේ තමා යම රජු හා සමාන බව  හඟවමින් බවට අදහසක් ඇත. දුටුගැමුණු රජුගේ භෂ්මාවශේෂ දක්ඛිණ ථූපයේ නිදන් කළේ ය. සිරිසඟබෝ රජු දැවූ ස්ථානයේ පසුකාලීනව විහාරයක් ඉදිකරීම, මහාසේන රජු මින්නේරි දෙවියන් ලෙස පිදුම් ලැබීම මෙන් ම ගජබාහු රජු දේවත්වයෙන් සැලකීම ජනතාව විසින් සිදුකරනු ලදහ. මේ අනුව පසුකාලීන රජවරු පත්වූ ඉහළ ම තත්ත්වය ''දේවත්වය'' ලෙස හඳුනාගත හැකි ය.  මෙරට රජවරුන් ඒකාධිපතීන් නො වූ බවත්, රජුට ඒකාධිපති බලයක් ඇති වුව ද, චාරිත්‍රවලට අනුව තිබූ බැදීම, කැරලිවලට ඇති බිය, සංඝයාගේ බලපෑම හා රාජ්‍යයත්වය ගැන තිබුණු ආගමික අදහස් ආදිය නිසා ඔහුගේ බලය සීමිත වූ බව මූලාශ්‍රයක්හි සඳහන් කරුණු මඟින් සනාථ වේ (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1964: 146-147). රජු සහ ඉහළම පරිපාලන ස්තරයේ සිට පහළම ස්තරය දක්වා සැකසුණු නිලධාරී පැලැන්තියකගේ බලය ජනතාවට දැනුණ ද ලංකාවේ රජවරු අවස්ථාව ලද හැම විටම ජනතාව සුඛිත මුදිත කරවීම සඳහා වාරි මාර්ග හා කෘෂිකර්මය නඟා සිටුවීමට වෙර දැරූහ. වෙහෙර විහාර කරවීමෙන් ශාසනයේ දියුණුවට සේවය කළහ. ඔවුන් බොහෝ විට ශ්‍රමය සංවිධානය කළේ රටේත්, රාජ්‍යයේත් අභිවෘද්ධිය හා සම්බන්ධ කටයුතුවලට ය. මේ සියලු කරුණු පිරික්සන විට කාර්ල් විට්ෆෝගල් විසින් පෙරදිග ලෝකයේ පුරාණයේ දී ''ඒකාධිපතිවාදයක්'' පැවතියේය යනුවෙන් දක්වා ඇති අදහස් ශ්‍රී ලංකාවේ පැරණි පාලන තන්ත්‍රය කෙරෙහි උචිත නොවන බව සිරිවීර විසින් පෙන්වා දී ඇත (සිරිවීර, 2004: 65, 66).

ඉහත සාකච්ඡා කළ කරුණු අනුව ''රජතනතුර'' සමඟ යෙදුණු මෙරට සම්ප්‍රදායන් අතුරින් රජු යුක්තියේ උල්පත සේ සැලකීම, රජු දේවත්වයට නැඟීම, රජුගේ සාධාරණ බව, මහජන සුභසාධනය, යහපාලන මූලධර්ම මත මෙරට පාලකයින් ක්‍රියා කළ බව පෙන්නුම් කෙරෙයි.

### 4.2 රජුගේ චරිත ස්වභාවය හා යහපාලනය

ප්‍රතිපත්ති ගරුක යහපත් රජුන් කෙරෙහි මහජනතාව තුළ පැවතියේ අසීමිත ගෞරවාදරයකි. රජුගේ නියෝග දිවි පුදා හෝ ඉෂ්ට කර දීමට ජනතාව සූදානමින් සිටියහ. එමෙන් ම කිනම් ආකාරයක බාධාවන් එළඹියත් ඉපැරණි රජවරු මහජනතාව සමඟ සමීපව සිටිමින් සිවු දෙස ම තම අණසක යටතේ පාලනය ගෙනයනු ලැබූ අවස්ථාවන් දක්නට ලැබේ. ඇතැම් රජුන් ස්වකීය ආධිපත්‍යය අවියක් කර ගනිමින් ජනතාව තලා පෙළා අධර්මිෂ්ඨ පාලනයක් පවත්වාගෙන ගිය අවස්ථා ද දක්නට ලැබී ඇත. කිසියම් රාජ්‍යයක, රාජ්‍යය පරාමාධිපත්‍යය තුළ පාලකයාගේ යහපත් හෝ අයහපත් චරිත ස්වභාවයේ දී පාලනයේ සංකූලතා ඇතිවීම නිතැතින් ම සිදුවන්නකි. රාජ්‍යයේ පාලකයා තේජාන්විත, ප්‍රතාපවත්, ඉවසීමෙන් යුතු

ගුණගරුක, ඥානාන්විත පුද්ගලයෙක් විය යුතු වේ. එමෙන් ම බෞද්ධ සූත්‍රධර්ම දේශනාවලට අනුව පාලකයා සතර අගතියෙන් තොර පුද්ගලයෙකු විය යුතු බව ද සඳහන් වේ.

රාජ්‍යය පාලනය කරන පුද්ගලයා එනම්, පාලකයා යහපත් ගති පැවතුම් ඇති දැහැමි පුද්ගලයෙකු නම් එම රාජ්‍යයයේ වැසියන් ද යහපත් බවින් යුක්ත වෙයි. රාජ්‍යය පාලකයෙකුගේ චරිත ස්වභාවය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී පාලකයා මනා පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු වීම මෙන් ම ඔහු තුළ යහපත් ගුණාංග පැවතීම පාලනයේ චිරස්ථිතික අභිවෘද්ධිය සඳහා බලපානු ලැබේ. මෙසේ රාජ්‍යය පාලකයෙකු තුළ තිබිය යුතු ගුණාංග පිළිබඳව සාකච්ඡා කිරීමේ දී, රටවැසියන් කෙරෙහි කාරුණික වීම, ගුණගරුක වීම, රටවැසියන්ට ඇහුම්කන් දීම, රටේ පවතින පොදු නීතිය සැමටම සාධාරණ ලෙස ක්‍රියාත්ම කිරීම, රටේ පාලන තන්ත්‍රය සැමටම සාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීම ආදිය පෙන්වා දිය හැකි ය. එමෙන් ම ආගමික වශයෙන් ද රජවරුන් ආදර්ශවත් විය යුතු වේ. රාජ කුමාරවරුන්ගේ චරිත හැඩගැස්වීමේ කාර්ය බොහෝ දුරට භික්ෂූන් වහන්සේලාට භාරව තිබුණු නිසා කුඩා කල සිට ම පාලකයන්ගේ චරිත කෙරෙහි උන්වහන්සේලාගේ ආභාසය බලපෑහ. දුටුගැමුණු කුමරු පිළිබඳව සඳහන් කර ඇති විස්තරයේ දී ලංකාවේ කුමාරවරුන් කෙරෙහි භික්ෂූන් වහන්සේලා බලපෑ අයුරු දකගත හැකි ය. උපන්දින උත්සවය, බත් කවන උත්සව වැනි උත්සවවලට භික්ෂූන් වහන්සේලා වැඩමවූහ. කුමාරවරුන්ට නම් තබන ලද්දේ ද භික්ෂූන් වහන්සේලා විසින් බව සඳහන් වේ (සද්ධාතිස්ස, 1934: 490, 491). සිරිසඟබෝ කුමරුට නම් තබන ලද්දේ ද භික්ෂූන් වහන්සේලා ඉදිරියේ යැයි එළු අත්තනගලු වංශයේ සඳහන් වේ (ධර්මාරාම, 1921: 08).

බුද්ධදාස රජතුමා (ක්‍රි. ව. 340-368) අසරණ රෝගීන්ට වෙදකම් කිරීමේ දී රජ බව අමතක කළ මහාකාරුණිකයෙක් විය. උපතිස්ස වැනි ඇතැම් රජවරු තම රාජ්‍යය කාලය තුළ ම රාජ භෝජන තබා පොදු බත්හලෙහි බත අනුභවයට තරම් නිහතමානී විය (බුද්ධදත්ත, 1959a: 37 පරි, 203 ගාථා). මහා පැරකුම්බා රජු ප්‍රතිපත්තියක් වශයෙන් සෑම පොහොය දිනකම ආරෝග්‍යශාලාවට ගොස් අසරණ රෝගීන්ට ප්‍රතිකාර කිරීමට පුරුදුව සිටියේ ය. ධාතුසේන රජුගේ රාජ්‍යය පාලන ප්‍රතිපත්තිය පිළිබඳ ව විමසා බැලීමේ දී මහණව සිට සිවුරු හැරපියා විත් ද්‍රවිඩ සතුරන්ගෙන් රට බේරා ගැනීමට තරම් ජාත්‍යාලයකින් යුක්ත වූ බව සඳහන් වේ. මෙයින් පැහැදිලි වන්නේ පාලකයා සියලු අභියෝග හමුවේ නිර්භයව ඉදිරියට ගමන් කළ හැකි පුද්ගලයෙක් විය යුතු බව යි (බුද්ධදත්ත, 1959a: 38 පරි, 18 ගාථා).

රජු කෙරෙන් කෙතරම් උසස් පැවැත්මක් බලාපොරොත්තු වූයේ ද යත් බෝධිසත්ත්වයෙකු මිස වෙන කිසිවෙකු ලක්දිව රජකම නොලබන බව අභයගිරි විහාරයෙන් ලැබුණු දහවන සියවසට අයත් සෙල්ලිපියක සඳහන් වේ (Wickramaingha, 1912: 50-56, 237). පාලකයා ප්‍රාණඝාත අකුසලකර්ම එනම්, සත්ත්ව හිංසාව සි≥ කරන, රටවැසියා විවිධ තාඩන පීඩනවලට ලක් කරන පුද්ගලයෙකු නම් එම රට තුළ ද අධර්මිෂ්ඨ සමාජයක් නිර්මාණය වේ. රාජ්‍යයේ වැසියන් පාලකයා අනුගමනය කිරීමට පටන් ගනී. මිනිසුන් කෙරෙහි පමණක් නො ව සියලු ම සතුන් කෙරෙහි කරුණාව දක්වූ රජවරුන් ද සිංහල රජුන් අතර විය. අමණ්ඩගාමිණී අභය, IV අග්බෝ, අඹහෙරණ සලමෙවන්, III කාශ්‍යප ඉන් සමහරෙකි (බුද්ධදත්ත, 1959a: 35 පරි, 40 පරි, 44 පරි, 46 පරි). මෙම රජවරු රට පුරා මාඝාතය පණවමින් සියලු ම සතුන්ට අභය දානය දී ඇත. දේශීය රජුන් තුළ දෘශ්‍යමාන වූ මෙබඳු උදාරගති ලක්ෂණ ජනතාව හා රජුන් අතර මනා සම්බන්ධතාවක් ඇති කිරිමට හේතු විය. එබැවින් යහපත් රාජ්‍යය පාලකයෙකුගෙන් රටට විය යුතු යුතුකම් හා වගකීම් පිළිබඳව

සඳහන් කිරීමේ දී බුදුන් වහන්සේ විසින් වදාළ පන්සිල් ආරක්‍ෂා කරන සමාජයක් ගොඩනැගීමට නම් පාලකයා පන්සිල් සුරකින, සෑම ආගමකට ගෞරව දක්වන දැහැමි පුද්ගලයකු විය යුතු ය. පාලකයා දැහැමි වන විට රට වැසියා ද යහපත් ගුණගරුක පුද්ගලයන් බවට පත්වේ. රජුගේ චරිත ස්වභාවය යහපත් රාජ්‍යයක් පවත්වාගෙන යාම සඳහා උපකාරී වන ප්‍රධාන ම සාධකයකි. රාජ්‍යයේ කටයුතු හා වගකීම් නිසියාකාරව ක්‍රියාත්මක කිරීම මඟින් රටෙහි පැවති අවුල් වියවුල් සංසිඳවා සාමය ඇති කළ හැකි වන නමුත් ඒ සඳහා පාලකයාගේ පෞද්ගලික චරිත ස්වභාවය දැඩි සේ බලපානු බව හඳුනාගත හැකි ය. දසරාජ ධර්ම, චතුස්සංවත්ථු ආදිය ඉපැරණි රජවරුන් දිනාගත් ගුණාංග ලෙස රජවරුන් වර්ණනා කිරීමේ දී මහාවංශ කතුවරයා යොදාගෙන ඇති බව සඳහන් වේ (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1964: 148, 149). මෙය සියලු ම පාලකයන් කෙරෙහි සත්‍ය නො වූව ද මේ ගුණාංග එකල මතය අනුව රජවරුන්ට තිබිය යුතු ඒවා බව සැලකිය හැකි ය. මෙම ගුණාංගවලින් අතීතයේ සිට ම පිළිගත් යහපාලන මූලධර්ම හා හර පද්ධතීන් පිළිබිඹු වේ.

### 4.3 පරිපාලන ව්‍යුහය හා යහපාලනය

රාජ්‍යයත්වය පිළිබඳ මෙන් ම පාලන සංවිධානයක ආරම්භය පිළිබඳව ද තොරතුරු රැසක් වංශ කථා මඟින් ඉස්මතු කොට තිබේ. ඉන්දියාවේ සිට පැමිණි පාලක පරපුරකට සම්බන්ධ කුමරුවකුගේ නායකත්වය යටතේ එකී පාලන නායකත්වයක් ඇති කරන ලද්දේය යන අදහස වංශ කථාවලින් පෙන්වා දෙයි (ඤාණවිමල, 1959: 21-38; බුද්ධදත්ත, 1959a: 47-74). ග්‍රාමීය හෝ ප්‍රාදේශීය සංවිධානයක් ලෙසින් ආරම්භව භෞමික වශයෙන් පැතිරෙමින් නායකත්වය වටා බලය ගොනු කර ගනිමින් පාලන කාර්ය මණ්ඩලයක ද සහයෙන් සමාජීය කාර්යයන් රැසක් ජනතාව වෙත විධිමත් අයුරින් ඉටු කිරීම රාජ්‍යයක් මඟින් සිදු කෙරෙයි. පුළුල් ප්‍රදේශයක් පාලනයට නතු වීමත්, සමඟ ඉටු කළ යුතු කාර්යයන් ද බහුල වන අතර ඒ සඳහා පාලන යන්ත්‍රය ද ක්‍රමවත් කළ යුතු වේ. එමෙන් ම පාලන අධිකාරිත්වය සියලු ස්තරයන් වෙත ගෙනයාමට ද කටයුතු කළ යුතු ය. මේ නිසා රාජ්‍යය බලය ව්‍යාප්ත කරලීමේ දී හා පාලන කාර්යයන් ඉටු කිරීමේ දී සංවිධානාත්මක බවකින් යුක්ත වීම අවශ්‍ය ය. පාලන සංවිධානයක ඇති සැකැස්ම පාලන ව්‍යුහය ලෙසින් හඳුනාගත හැකි ය. ආරම්භයේ සිට අනුරාධපුර යුගය අවසානය දක්වා මෙරට පාලකයින් පවත්වාගෙන යනු ලැබූ රාජ්‍ය පරිපාලන ව්‍යුහය පිළිබඳ පරීක්‍ෂා කර බැලීම මෙහි දී සිදු වේ. පෙර සිරිත කඩ නොකරමින් තමන්ට පූර්වයෙන් සිටි පාලකයින් අනුගමනය කළ පාලන නීතිරීති උල්ලංඝනය නොකර පාලනය ගෙනයෑම සිංහල රජවරුන් මහත් ගෞරවයක් ලෙස සැලකූ අන්දම වංශ කථා තුළින් සහ ශිලා ලේඛන මඟින් මනාව ගම්‍ය වේ. රජු විසින් රටේ නායකත්වය දරමින් වැසියන්ගේ දුක් කරදරවලට විසඳුම් දෙමින් මනා රාජ්‍ය පාලනයක් ඇති කිරීමට පියවර ගන්නා ලදි.

අනුරාධ ගාමය සියලු නගර අංගයන්ගෙන් සමන්විත කර එහි පාලනය හා සනීපාරක්ෂාව ක්‍රමවත් කළ බව වංශ කථාවන්හි සඳහන් වේ. පාලන කටයුතු සඳහා පුරෝහිත, නගර ගුත්තික, භාණ්ඩාගාරික තනතුරු ඇති කරමින් ප්‍රථමවර නගර ආරක්‍ෂක ක්‍රමයක් ඇති කළ බව පණ්ඩුකාභය කාල පරිච්ඡේදය දී පැහැදිලි වේ. ජනාවාස බිහි වීමෙන් පසු රටේ ක්‍රමික පාලන සංවිධානයකට මුල පිරෙන මේ කාර්යය ඓතිහාසික අතින් මෙන් ම පරිපාලන ව්‍යුහය තුළ කැපී පෙනෙන වැදගත් ලක්‍ෂණයකි. රාජ්‍යය පරිපාලන ව්‍යුහය තුළ රජු විසින් පත් කරන ලද උසස් නිලධාරීන් බොහෝ දෙනෙක් රජතුමාට අයත් භාරධූර කටයුත්තෙහි දී සිය කාර්ය කරගෙනයාම සඳහා සහය දුන් නිලධාරීන් අමාත්‍යවරු ලෙස හැඳින්වූහ. ශිලා

ලේඛනවල ''ඇමති'', ''අමෙත'' නමින් ද වංශ කථාවල ''අමච්ච'', සච්ච හෝ මන්ත්‍රීන් යනුවෙන් ද ඔවුන් හැඳින්වූහ (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931). අමච්ච යන පොදු නාමයෙන් රජුගේ සභයට සිටි ඉහළ නිලධාරීන් හැඳින්වූ බව පෙනේ. විජයගේ මරණින් පසු අමාත්‍යවරුන් රජ තනතුරේ වැඩබලා තිබෙන බව මහාවංශයට අනුව පැහැදිලි වේ. කාවන්තිස්ස රජුගේ මරණින් පසු සද්ධාතිස්ස හා දුටුගැමුණු රජු අතර ඇතිවන්නට ගිය අරගලය සමතයකට පත්වනු ලබන්නේ මේ අමාත්‍යවරුන්ගේ මැදිහත්වීමෙනි. චෝළයන්ට එරෙහිව හය වන කාශ්‍යප රජුට ආධාර කළ යුද හමුදාවේ අණදෙන නිලධාරියෙකු වූ බුද්ධ නැමැත්තා වංශ කථා හඳුන්වා දී ඇත්තේ බුද්ධ නම් ඇමති යනුවෙනි (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931: 55 පරි). අනුරාධපුර යුගයේ ප්‍රථම භාගයේ දී මහාමච්ච නමැති තනතුරක් පිළිබඳ සඳහන් වන අතර එය අමච්ච නමැති තනතුර සමඟ වෙනස් වූයේ කෙසේ ද යන්න පිළිබඳව කිසිදු විග්‍රහයක් නො දක්වයි. දේවානම්පියතිස්ස රජුගේ බෑනා කෙනෙකු හා ඔහුගේ ඇමතියෙකු වූ මහා අරිට්ඨ කුමාරයා වංශ කථාවේ හඳුන්වා ඇත්තේ මහාරිට්ඨ මහාමච්ච යනුවෙනි (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931, 16 පරි). පූර්ව බ්‍රාහ්මී යුගයට අයත් අක්ෂරවලින් ලියවුණු රිටිගලින් හමු වූ සෙල්ලිපි දෙකක ම "මහමත" "බඹදත" නම් වූ නිලධරියෙකු ගැන කියවේ (Wickramasingha, 1912). දුට්ටගාමිණී අභය රජු කල බොහෝ යුද්ධ නායකයන් අමච්ච නමින් හඳුන්වා තිබෙන අතර වට්ටගාමිණී අභය රජු කල හා වසභ රජු කල ප්‍රාදේශීය පාලකයන් හඳුන්වා ඇත්තේ අමච්ච නමින් බව මූලාශ්‍රයගත තොරතුරු අනුව පැහැදිලි වේ. මෙවැනි තනතුරු මහජන සුභසාධනය හා යහ පාලනයකට වැදගත් විය.

රාජ්‍යය පාලනයේ දී සේනාපති තනතුර මීළඟ වැදගත් පදවිය විය. ඉතා උසස් බලතල සහ වගකීමක් ඇතිව පැවති තනතුරක් ලෙස මෙය හැඳින්විය හැකි අතර, යුද හමුදාවේ නායක තනතුර ද උසුලනු ලබන්නේ සේනාපති විසිනි. රාජ්‍යය සංවිධානය බිහි වීමෙන් පසු සෙන්පතියනට වැඩි බලයක් හිමි වූ බව පැහැදිලි ය. මුල් කාලීන ශිලා ලේඛනයන්හි සෙන්පතියන් පිළිබඳ සඳහන් වේ. මහාකච්චට්කෝඩි, සිතුල්පව්ව, රිටිගල, වැලඑල්ලුගොඩකන්ද, කුඩුම්බිගල එම ශිලා ලිපි වේ. (Paranavitana, 1970: No, 322, No. 620, No. 724, No. 500, No. 251). මහාවංශයේ සඳහන් වන දීඝනන්ද නම් වූ සෙනෙවියා දේවානම්පියතිස්ස රජුගේ සෙන්පතියා වූ බව සඳහන් වේ (Paranavitana, 1970: No, 665). ක්‍රි. පූ. යුගයට අයත් බ්‍රාහ්මී ශිලා ලේඛනවල සඳහන්වන ''පරුමක'' නමින් හැඳින්වෙන කුලීනයන් අතරින් මේ තනතුර සඳහා සුදුස්සෙකු තෝරා පත්කරගනු ලැබිණි. අවසාන කාලයේ දී මේ තනතුරට රජුගේ ළඟ ම ඥාතියෙකු පත්කරගත් බවට සාධක පවතී. හත්ථවනගල්ල විහාරවංශයට අනුව සිරිසඟබෝ රජතුමාගේ සෙන්පතියා වූයේ රජු හා සමඟ මහියංගණයේ සිට පැමිණි තමාගේ ළඟ ම නෑයකු හා ඔවුන්ගෙන් පසු රජකමට පත් ගෝඨාභය කුමරු ය (ධර්මාරාම, 1921: 18). කුඤ්චනාග රජතුමාගේ පාලන සමයේ දී එතුමාගේ බිසවගේ සොහොයුරා සේනාපති තනතුර දරා තිබේ. ධාතුසේන රජුගේ සෙන්පතියා වූයේ රජුගේ බෑනා කෙනෙකු වූ මිගාර නම් වූ කුමාරයෙකු ය (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931: 38 පරි). ලිඛිත මූලාශ්‍රය පෙන්වා දෙන අන්දමට බල්ලාටනාග රජුගෙන් රාජ්‍ය පැහැරගෙන ඇත්තේ ද මහාරක්ඛ නම් ඔහුගේම සෙන්පති පදවිය දරූ පුද්ගලයෙකි (බුද්ධදත්ත, 1959a: 33 පරි; 1996: 33 පරි).

අනුරාධපුර යුගයේ අග භාගයේ දී ඇතැම් යුද හමුදා අණදෙන නිලධාරින් දරාසිටි තවත් නිල නාමයක් වූයේ විදුරගුණ යන්න යි. වංශකථාවට අනුව රුහුණේ ආදිපාද කිත්තග්ගබෝධි

කුමරුට එරෙහිව දියත් කළ ආක්‍රමණය මෙහෙය වූයේ මේ විරුදනාමය දරූ යුද හමුදා අණ දෙන නිලධාරියෙකි (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931). සෙනෙවිරද් යටතේ පාරම්පරික සන්නද්ධ හමුදා සේනාංකයන්ගෙන් සමන්විත බලයක් පැවති බව වංශකථාවන්හි සඳහන් වේ (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931). අභිලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රය අනුව ක්‍රි. පූ. තෙවන සියවසේ අග භාගයේ සිට එල්ල වූ විදේශීය ආක්‍රමණයන් සමග ම සේනාපතියාගේ වටිනාකම ක්‍රමයෙන් ඉහළ ගිය බව හඳුනාගත හැකි ය. පරසතුරු විදේශීය ආක්‍රමණ මෙන් ම, රාජ්‍ය විරෝධි කැරලි, කුමන්ත්‍රණ මැඩ පැවැත්වීමට රජුට මෙවැනි තනතුරුවලින් මනා පිටුවහලක් ලැබුණි. එය ජනතා ආරක්ෂාව තහවුරු කිරීමට උපකාරී වූ බව පැහැදිලි වේ.

සේනාපති පදවියට පසුව ඊළඟ උසස් තනතුර වූයේ ''බඩගරික'' පදවිය යි. බඩගරික තනතුර පිළිබඳව සමකාලීන ශිලා ලිපිවල බොහෝ විට සඳහන් වේ (Paranavitana, 1970: No. 1192). පැරණි සෙල්ලිපිවල සඳහන් කරන ලද භාණ්ඩාගාරිකයන් කීප දෙනෙක් ''පරුමක'' නමැති කුලීන ගණයට අයත් වූහ. ක්‍රි. පූ. යුගයට අයත් ලෙන් ලිපියකට අනුව පරුමක සුමන නම් වට්ටගාමිණී අභය රජුගේ භාණ්ඩාගාරිකයෙකු ගැන සිතුල්පව්වෙන් ලැබුණු ලිපියෙහි සඳහන් වේ (Paranavitana, 1970: No. 621). මේ රජුගේ ම තවත් භාණ්ඩාගාරිකයෙකු වූ සංඝ නම් අමාත්‍යවරයෙකු ගැන සහස්සවත්ථුපකරණයේ සඳහන් වේ (බුද්ධදත්ත, 1959b: 174). කුරුණෑගල දිස්ත්‍රික්කයේ රාගල විහාරයේ ඇති ලෙන් ලිපියක රජකුගේ භාණ්ඩාගාරික තනතුර දරූවෙකු හඳුන්වා ඇත්තේ අමතය බඩගරික අභලි යනුවෙනි (Paranavitana, 1970: No. 1192). මෙවන් තනතුරු මඟින් පැහැදිලි වන්නේ යහ පාලනයකට අවශ්‍ය පරිපාලනයක් පවත්වාගෙන යාමට අතීත රජවරු ක්‍රියා කළ බව යි.

රාජ්‍යය පාලනයේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සමස්ත රාජ්‍යය භාණ්ඩාගාරය ශක්තිමත් වීම සහ ශක්තිමත් කිරීම වැදගත් වේ. මේ සඳහා විශ්වසනීය නිලධාරියෙකු පත්කිරීමට රජු වගබලාගත යුතුය. එවැනි නිලධාරීන් පිළිබඳව සිතුල්පව්ව, නුවරකන්ද, රිටිගල, මිහින්තලය, කන්දෙගම කන්ද යනාදී ශිලා ලේඛනවල සඳහන් වේ (Paranavitana, 1970: No. 245, 621, 916, 1035). අනුරාධපුර අගභාගයේ දී මෙම තනතුර එම ස්වරූපයෙන් ම නොතිබුණු අතර පොළොන්නරු යුගයට අයත් සෙල්ලිපිවල හා පොළොන්නරු යුගයට අදාළ වංශ කථානුගත තොරතුරුවල භාණ්ඩාගාර පොත් යනුවෙන් මෙය හඳුන්වා තිබේ. ජාතක අටුවා ගැටපදය භාණ්ඩාගාර පොත් යන පදයට අර්ථ දී ඇත්තේ භාණ්ඩාගාරික යනුවෙනි (ජයතිලක, 1943: 180). පැරණි ලියකියවිලි අනුව පළාත්වලට ද භාණ්ඩාගාරිකවරුන් පත්කර සිටි බව සඳහන් වේ. නවවන හා දහවන සියවස්වලට අයත් අත්තානි ටැම් ලිපිවලට අනුව භාණ්ඩාගාරිකගේ සහයකයින් ලෙස පිරිසක් සේවය කර තිබේ. දෙරුවන හෝ දෙරුවන වැස්සන් (භාණ්ඩාගාරික ද්වරයේ නිලධාරීන්) ලෙස ශිලා ලේඛනයන්හි දක්වා ඇත්තේ මොවුන් ය. ''ගණක'', ''මහගණක'' යනුවෙන් හැඳින්වූ නිලධාරියෙකු රජුට සහය දක්වා ඇත. රාජ්‍ය භාණ්ඩාගාරය හා සබැඳි ප්‍රධාන නිලධාරියකු ලෙස මොහු හැඳින්විය හැකි ය. ගණකාධිකාරීවරයා රාජ්‍ය මූල්‍යමය කටයුතු පාලනය කරන්නට ඇත. වර්තමානයේ මුදල් අමාත්‍යවරයාට සමාන කාර්යයක් ඔහු ගෙන් ඉටුවෙන්නට ඇති බව සිතිය හැකි ය. අශෝක රජතුමා වෙත යවනු ලැබූ දූතයන් අතර ''ගණක'' නමැති නිලධාරියෙක් ද විය. මෞර්ය අධිරාජ්‍යයා විසින් ඔහුට ''සෙට්ඨී'' යන උපාධි නාමය පිරිනමන ලද්දේ ය (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931: 11 පරි). ගණකයන්ට අමතරව තවත් ශ්‍රේණි කිහිපයකට අයත් නිලධාරින් පිරිසක් ද භාණ්ඩාගාර සේවයේ නිරත වී සිටි බව පෙනේ.

''මහලේ'' නම් තනතුරක් පිළිබඳ ව මොනරාගල ලිපියේ සඳහන් වේ. රාජ සභාවේ ප්‍රධාන ලේඛකයා වූ මොහු රාජ සන්නස් ආදිය භාරව සිටින්නට ඇත. හතරවන කස්සප රජුගේ මහලේඛන පදවිය සේන නැමැත්තෙකුට පිරිනමා තිබුණු බව මහාවංශයේ සඳහන් වේ. මහලේඛන හෙවත් මහලේකම්හට යටත් නිලධාරීහු ''කුඩසලා'' යන නමින් හැඳින්වූහ. ''වත්කැමි'' යන නම ද ඔවුනට යෙදූ බව ශිලා ලේඛන අනුව තහවුරු වේ. මහලේ, මහලේඛන භාණ්ඩාගාරය භාරව සිටියා විය හැකි අතර ඔහු යටතේ වූ නිලධාරීන් ආර්ථික කටයුතුවල නිරතවන්නට ද ඇත. කෞටිලය අර්ථ ශාස්ත්‍රයට අනුව කෘෂිකර්මය හා ගව පාලනය ආදී අර්ථ සංරක්ෂණයට යෙදී ඇති ''වාර්තා'' යන්නට ''වත්'' යන්න සමානකමක් පෙන්වයි. එබැවින් අනුරාධපුර යුගයේ මෑතකාලීනව භාණ්ඩාගාරය බාරව සිටි නිලධාරියා මහලේ හෙවත් මහලේඛක නමින් හඳුන්වන්නට ඇති බව පරණවිතානගේ අදහස යි. පළමුවන පරාක්‍රමබාහු රජු මායා රටේ පාලකයාව සිටි කාලයේ දී ඔහුගේ යුද හමුදා හා රුහුණේ මනාභරණ රජුගේ යුද හමුදා අතර ඇති වූ සටන් ලේඛනගත කිරීමේ දී වංශ කථාව එම පාලකයන් දෙදෙනා යටතේ සේවය කළ මහාලේඛකවරුන් කීපදෙනෙකු ගැන සඳහන් කොට ඇත (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931). රාජ්‍යය පාලනය ක්‍රමවත්ව ගොඩනැගීම සඳහා රජු වටා ඒකරාශී වූ නිලධාරී මඩුල්ලක් සිටීම වැදගත් වේ. දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික යනාදී අංශ ක්‍රමවත්ව සංවිධානය කිරීම සඳහා ඒ ඒ අංශ භාර අධ්‍යක්ෂකවරයෙක් විය. ක්‍රි. පූ. තෙවනි සහ පළමු වන සියවස අතර කාලයට අයත් අභිලේඛනවල සඳහන් ''අදෙක'' නැතහොත් ''අදකවරු'' පාලන කාර්යයන් සඳහා සිය දායකත්වය ලබාදුන් පිරිසක් වේ. අදෙක යන වචනයෙහි ''අධ්‍යක්ෂක'' යන අරුත් ගැබ්ව ඇති බව පරණවිතාන පෙන්වා දෙයි. නිදසුන් වශයෙන් පකර අදෙක (මාර්ග අධ්‍යක්ෂක), පණ අදෙක (වාණිජ අධ්‍යක්ෂක), හති අදෙක (හස්ති අධ්‍යක්ෂක), අශ අදෙක (අශ්ව අධ්‍යක්ෂක), සිවික අදෙක (දෝලා අධ්‍යක්ෂක), රූප අදෙක (නාට්‍ය අධ්‍යක්ෂක) ආදිය පෙන්වාදිය හැකි ය. රාජ්‍යයේ මුල් අවධිය සම්බන්ධ නිලධාරී පිරිසක් වන ''අදෙකවරු'' ගැන පසුකාලයේ දී තොරතුරු විරල ය. පාලන කටයුතු පුළුල්වීමත් සමඟ ම අධ්‍යක්ෂකවරුන්ට පැවරුන කාර්යයන් ද වැඩිවීම මත වෙනත් නිල නාමයන්ගෙන් පෙනී සිටින්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

රජුගේ පාලන කටයුතු ක්‍රමවත්ව කරගෙන යාම සඳහා මේ අවධියේ දී උසස් තනතුරු රාශියක් පැවති බව පෙනේ. උසස් ම තනතුරුවලට පත්කර ගන්නා ලද්දේ රජුට ඥාති සම්බන්ධය ඇතිව සිටි අයගෙනි. ඡත්තගාහක, අසිග්ගාහක, සේනාධිපති, මහාලේඛක, පස්ලදු, රට්ලදු, දණ්ඩනායක සහ මහවෙදනා ආදී තනතුරුනාම මහාවංසයේ ඇතුළු මූලාශ්‍රයයන්හි මෙන් ම ශිලා ලේඛනයන්හි දක්නට ඇත. මින් ඡත්තගාහක හා අසිග්ගාහක යන නිලධාරීන් දෙදෙනා විධායක කාර්යවලට සම්බන්ධ නො වූහ. දේවානම්පියතිස්ස රජු විසින් ගෞතම නම් කුමාරයකු වෙත ඡත්තගාහක තනතුර පිරිනැමූ බව බෝධිවංශයේ සඳහන් වේ (සේනාධීර, 1970). මහානාම රජුගේ අභිෂේක ලත් බිසවගේ දුවණිය වූ සංඝා කුමරිය විසින් සොත්ථිසේන කුමරු මරවන ලද්දේ මීට පෙර දී ඡත්තගාහක ධූරය දරාසිටි ඡත්තු නමැති ස්වකීය සැමියා ලවා ය (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931: 38 පරි). ඉන්පසු අනුරාධපුර රාජධානි සමයේ අවසානය වන තෙක් මේ ධූරය පිළිබඳ ව අසන්නට නො ලැබේ.

පළමුවන මුගලන් අසිග්ගාහක ධූරයට පත් කර ගත්තේ සිලාකාල නමැති කුමරෙකි. සංඝතිස්ස ද රජ වීමට පළමු දෙවන අග්බෝ රජුගේ අසිග්ගාහක ධූරය දැරී ය (ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ, 1931). ඡත්තගාහක හා අසිග්ගාහක ධූර තුළ විධායක කටයුතු පැවරී

නොතිබී නමුත් චාරිත්‍රමය කටයුතු ඉටු කළ මොවුන් රාජ සභාවේ ප්‍රධාන නිලතල ඉසිලූ බව පැහැදිලි ය.

රටක් සතුව විවිධ ආදායම් මාර්ග පවතී. එනම්, වැව් අමුණුවල ආදායම්, බදු, කෘෂි බෝග, ඉඩම්, දේශීය හා විදේශීය වෙළෙඳාම විවිධ කර්මාන්ත ආදිය ඒ අතර විය. රජුට ලැබෙන මෙම ආදායම් එකතු කිර දීමෙන් රජුට සහය දැක්වූ නිලධාරීන් සමූහය එක් එක් අංශයන් කෙරෙහි යොමුකර තිබුණි. මුල් යුගයේ සෙල්ලිපිවල සඳහන්වන ආකාරයට ගොවීන්ට තමන්ගේ නිෂ්පාදනවලින් හයෙන් පංගුවක් හෝ දහයෙන් පංගුවක් රජුට ගෙවීමට සිදු විය. බෝජකපති හෝ බොජියපති ලෙස සෙල්ලිපිවල මෙම බද්ද හඳුන්වා තිබේ (Paranavitana, 1970). වැව් අමුණුවල පරිබෝජිත ජලය වෙනුවෙන් බද්දක් ද අයකර තිබෙන අතර එය වංශ කථාවේ උදකභාගය හෙවත් දකභාග යනුවෙන් ද සෙල්ලිපිවල දකපති හෝ දකබක යනුවෙන් හඳුන්වා තිබේ (Paranavitana, 1970). රජුට මේ සියලු ආදායම් එකතු කිරීමෙන් සහය වූ නිලධාරියා ''අයකැමි'' ලෙස හඳුන්වා තිබේ. මොවුන් පොදුවේ ''රදොල් '', ''රජ්කොල්කැමි'' යන නමින් ද හඳුන්වා ඇත. ආරක්ෂක භේවායන් ''අරක්කැන්'' වශයෙන් ද කුඹුරු ගොවිතැන් පරීක්ෂකයන් ''පියොවදාරන්නන් '' යන නමින් ද සෙල්ලිපිවල සඳහන් වේ. රජුගේ කුලීනයන්ගේ පිරිවරට යගදා ගත් අය, කස පුපුරවන්නන්, බෙරවයන්නන් අයත් ව සිටි බවට සාධක ඇත. පූර්වයෙන් සාකච්ඡා කළ නිලධාරීන් රාශියක් ගැන පසුකාලීන සෙල්ලිපිවල සඳහන් වේ. ඔවුන්ට පැවරී තිබුණ කාර්යභාරය මේ යැයි ඉඳුරාම කිව නොහැකි ය. මේ අනුව වර්ධිත නිලධාරීන් පිරිසක් වටා ගොඩනැගුණු සංවර්ධිත රාජ්‍ය පරිපාලන ව්‍යුහයක් පවතින්නට ඇතැයි සිතීමට මෙය අවකාශ වේ. එවැනි පරිපාලනයක් මඟින් යහ පාලනයක් රට තුළ ගොඩ නැගීම සිදු විය.

### 4.4 අධිකරණ පාලනය හා යහපාලනය

පුරාතන ලංකාවේ අධිකරණ ක්‍රමය පිළිබඳව බොහෝ තොරතුරු වංශ කථාවලින් මෙන් ම සෙල්ලිපි මූලාශ්‍රයවලින් ද හමු නොවන අතර ඒ අඩුව අනුරාධපුර මුල්යුගයට අයත් පාලි අටුවා ග්‍රන්ථ මඟින් තරමක් දුරට හෝ සපුරාගත හැකි බව පෙනී යයි. අපේ පැරණි රජ දරුවන් කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය හා මානව ධර්ම ශාස්ත්‍රය හදාරා තිබුණු බවට සාක්ෂි ලැබෙන හෙයින් මෙම ග්‍රන්ථ දෙකෙහි ගැබ්ව ඇති අධිකරණ ක්‍රමයෙහි අභිලාෂය ලංකාවේ අධිකරණ ක්‍රමයට ලැබී ඇතැයි ''පුරාතන ලංකාවේ අධිකරණ ක්‍රමය'' නම් ලිපියේ දී සිරිමල් රණවැල්ල විසින් පෙන්වා දෙන බව වාච්චගේ (2001) සඳහන් කරයි. එබැවින් පාලි අටුවාවල සහ ජාතක කථා සාහිත්‍යයෙහි අධිකරණය පිළිබඳ ව කියවෙන තොරතුරු හා වංශ කථානුගත මූලාශ්‍රය මෙන් ම අභිලේඛන මූලාශ්‍රයන්හි සඳහන් තොරතුරු සියල්ල පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී දිවයිනේ අධිකරණ ක්‍රමය පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැකි වනු ඇත.

දිවයිනේ සෑම පාලන කටයුත්තක දී මෙන් ම අධිකරණ පාලන කටයුතුවල දී ද ප්‍රධානියා වශයෙන් ක්‍රියාකළේ රජතුමා ය. රාජ්‍ය සංවිධානයක් මඟින් වැසියන් අපේක්ෂා කරන මූලික කරුණක් වූයේ නීතිය නිසි පරිදි ක්‍රියාවේ යෙදවීමත්, අධිකරණයේ හා දණ්ඩනයේ සම භාවයත් ය. සද්ධර්මරත්නාවලියෙහි එන ''වොටුනු පලන් රජදරුවන් අධිකරණයෙහි හුනා මනා බැවිනි.'' යන පාඨයෙන් මේ බව හෙළි වේ (ඤාණවිමල, 2004: 257). රට පාලනය කිරීමේ දී සමාජ විරෝධී සහ නීති විරෝධී ක්‍රියා කළ අයට දඬුවම් පැමිණවීමට රජුවෙත නිල බලයෙන් ම බලය පැවරී තිබුණු බව අමාවතුරෙහි එන, "කැත් කුලෙහි උපන් අභිෂික්ත

රජහට උහුගේ රට ඉසුරු පවත්ති, මරවන්නට නිස්සන් මරවන්නට, ධන හානියට නිස්සන් දිළිඳු කරවන්නට, රටින් නෙරවන්නට නිස්සන් රටින් නෙරවන්නට ය." යන පාඨයෙනි හෙළි වේ (බුද්ධදත්ත, 1958: 140).

යුක්තිය පසඳලීම රජුගෙන් ඉටුවිය යුතු වූ ප්‍රධාන කාර්යයක් වූ බැවින් සතර අගතියෙන් තොරව අපක්ෂපාතීව එය ඉටුකිරීම සඳහා රජු එයට අදාළ නීතිරීති පිළිබඳව මනා දැනුමක් ලබා සිටිය යුතු විය. දිවයිනේ ඉපැරණි රජවරුන් අධිකරණය හා පරිපාලනය සම්බන්ධ නීති රීති කෙරෙහි මනා දැනුමක් ඇතිව කටයුතු කළ බවට තොරතුරු මහා වංශයෙන් ඉදිරිපත් වේ. මහා වංශය වළගම්බා රජු "නීතිමා" හෙවත් නීතිය දත් අයකු වශයෙන් පෙන්වා දී ඇත (බුද්ධදත්ත, 1959a: 36 පරි). වෝහාරික තිස්ස රජු අධිකරණ ව්‍යවහාරයෙහි හෙවත් ධර්ම ව්‍යවහාරයෙහි පණ්ඩිතයෙකු ව දක්ෂයකු ව සිටි බව වංශ කථාවේ සඳහන් වේ (බුද්ධදත්ත, 1959a:36 පරි). මුල් යුගයේ අනුරාධපුරයේ රජ කළ සිරිසඟබෝ රජු පිළිබඳ ව සඳහන් කරන මහාවංශය රාජ්‍ය විරෝධී කැරලිවරුන් කිහිපදෙනෙකු රජු වෙත විනිශ්චය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ ඔවුන් සම්බන්ධයෙන් රජු ක්‍රියාකළ ආකාරය විස්තර කරයි (බුද්ධදත්ත, 1959a: 36 පරි). රාජ කුමාරවරුන් හා රජයේ උසස් නිලධාරීන්ට එරෙහි ව විනිශ්චයකරුවන් වෙතට එන සියලු ම නඩුවල අවසාන වශයෙන් තීන්දුව නියම කිරීම රජු වෙත යැවීමට නියම වූ බව මූලාශ්‍රයන්හි සඳහන් වේ. සමන්තපාසාදිකාව දක්වන තොරතුරුවලින් පෙනී යන්නේ පාලනයන් අධිකරණ කටයුතු වඩාත් සාධාරණව ගෙනයෑම සඳහා දැඩි කැපවීමකින් ක්‍රියාකළ බව ය (ධර්මකීර්ති, 1990: 306, 307).

මෙරට නොයෙක් ස්ථානයන්හි ස්ථාපිත කර තිබූ ප්‍රාදේශික අධිකරණ ශාලා පිළිබඳව තොරතුරු රැසක් මූලාශ්‍රයගත කරුණු විග්‍රහ කර බැලීමේ දී අනාවරණය කරගත හැකි ය. එළාර රජු පරාජය කොට අනුරාධපුර රාජධානිය එක්සත් කළ දුටුගැමුණු රජතුමා අනුරාධපුරයේ රාජ්‍යයත්වයට පත්වීමෙන් අනතුරුව "හැම තැන්හිම මැදිහත්ව පැමිණ අධිකරණ විචාරණයේ නියෝග කොට අධිකරණ ශාලා කර වූ බව සිංහල ථූපවංශයෙහි කියැවේ" (විමලබුද්ධි, 1966: 238). පළමුවන ගජබාහු රජුගේ කාලයේ දී රුහුණු රටැ දුබලයහටි ගම හා අකුජු මහගම නමින් හැඳින්වුණු ගම් දෙකක පිහිටා තිබුණු මහා විනිශ්චය ශාලා දෙකක් ගැන සිතුල්පව්වෙන් ලැබුණු සමකාලීන සෙල්ලිපියක සඳහන් වී ඇත (Paranavitana, 1970). මේ ලිපිය අනුව යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරිමට ප්‍රධාන විනිශ්චය ශාලා මෙන් ම කුඩා විනිශ්චය ශාලා ද පවතින්නට ඇතැයි සිතිය හැකි ය. ක්‍රි. ව. දසවන සියවසට අයත් වේවැල්කැටිය පුවරු ලිපියෙහි උතුර්පසැ අම්ගම් කුළියෙහි දසගමෙකැ පිහිටුවා තිබූ උසාවියක් පිළිබඳ තොරතුරු සඳහන් වේ (Paranavithana, 1983). සිවුවන උදය රජුගේ රාජ්‍ය කාලයට අයත් මෙම ලිපියේ පිටපත් කහටගස්දිගිලිය, අනුරාධපුර වෙස්සගිරිය, මලුවෙයාය, වන්නඩිපාලම, කුරුම්පුලියන්කුළම, මීහොඳවැව, කොට්ටපිටිය, සේරුවිල-සෝමපුර, ඉලක්කට්ටුඑබ, හිඟුරක්ගොඩ, දොඹගහවෙල ආදී වූ තවත් ස්ථාන දොළසකින් පමණ සොයගෙන ඇති හෙයින් ද ඒ ලිපිවල සඳහන් ව ඇත්තේ ඒ ඒ පෙදෙස්වල දසගම්වල පිහිටුවා තිබුණු උසාවි පිළිබඳ ව හෙයින් ද එකල ලංකාවේ පිහිටා තිබූ සෑම දසගමක ම මෙවැනි උසාවි පිහිටුවා තිබුණැයි සිතිය හැකි ය (Paranavithana, 1983). මේ අනුව තමන්ට පමණක් තනිවම තම විජිතයේ සෑම ගමක ම නගරයක ම හෝ ජනපදයක ම යුක්තිය පසිඳලීමට රජු අපොහොසත් වු බැවින් තමන්ගේ මහාධිකරණ ශාලාවට අමතරව තම විජිතයෙහි නොයෙක් ස්ථානවල අධිකරණ ශාලා පිහිටුවා විනිශ්චයකරුවන් පත්කොට අනායාස නිවාරණය කිරීමට රජුට සිදුව තිබෙන බව පැහැදිලි

ය. මේ බව සමන්තපාසාදිකාවෙහි එන ඇතැම් විස්තරයන් තුළින් ද තහවුරු වේ (හේවාවිතාරණ, 1929: 222).

සාමාන්‍ය වශයෙන් නඩු ඇසීම හා දඬුවම් පැනවීම භාර වූයේ අධිකරණ නායක හෙවත් දණ්ඩනායක නමැති නිලධාරියාට ය. රාජාධිකරණයේ දී ප්‍රධාන වශයෙන් විභාග කෙරුණේ පහළ උසාවිවල තීරණවලට විරුද්ධව ඉදිරිපත් කෙරුණු කන්නලව් හෙවත් අභියාචනා වුව ද ඇතැම් නඩු පළමුවරට රජු විසින් ම විභාගයට ගත් බවට ද සාක්ෂි ඇත. එළාර රජු දවස අනුරාධපුරයේ පිහිටුවා තිබුණු රාජාධිකරණය ඉදිරිපිට ඒ රජු විසින් ම ප්‍රථමවරට විභාග කෙරුණු සුළු නඩු කිහිපයක් පිළිබඳව මහාවංශයෙහි සඳහන් වේ (බුද්ධදත්ත, 1959a: 21 පරි). තමන් වෙත ඉදිරිපත් කෙරෙන චූදිතයන් විසින් කරන ලදැයි සැක කෙරෙන අපරාධ මෙන් ම චූදිතයින් විසින් ඉදිරිපත් කෙරෙන අභියාචනා විභාග කිරීමේ දී ද රජු සතර අගතියෙන් තොරව මධ්‍යස්ථව සිටිය යුතු විය. ''රජ්ජුරුවන් නම් කාරණා කාරණ පරීක්ෂා කොට තරාදියක් මෙන් මධ්‍යස්ථ වන්නට වටනේ ය. රජහු විසින් යම් වරදක් කළාහුට නිග්‍රහ කරතත් පරීක්ෂා කොට දුර දිග බලා කළ වැරැද්දට නිසි නිග්‍රහ කරන්නේය. අපරීක්ෂාකාරීව කිපී සිතට නිග්‍රහ යෙදිය යුතු නොවෙයි.''යනුවෙන් පන්සිය පනස්ජාතක පොතෙහි සඳහන් වෙයි (ඤාණවිමල, 1929).

රජුට තම රටේ ජනතාවගේ අභිවෘද්ධිය තකා කටයුතු කරන පාලන අධිකාරීත්වයට එරෙහිව ක්‍රියාකරන්නන් පිළිබඳ ව සොයාබලා ඔවුන්ට දඬුවම් පැමිණවීමේ කාර්ය සිදු කළ යුතුව තිබුණු බව දොළොස්වන සියවසට අයත් අමාවතුර කෘතියෙහි සඳහන් විය (බුද්ධදත්ත, 1958). හතරවන මිහිඳු රජුගේ වේවැල්කැටිය ලිපියට අනුව මෙකල සමාජයේ සිදු වූ අපරාදවලට දඬුවම් ලබාදීම සිදු කළ යුතු අකාරය පිළිබඳව සඳහන් කර ඇත (Wickramasingha, 1912: 245,246). තුන්වන උදය රජුගේ බදුලු ලිපිය, පස්වන කාශ්‍යප රජුගේ පුවරු ලිපිය ආදී ලේඛන තුළින් අනුරාධපුර යුගයේ පැවති අධිකරණ සංවිධානය පිළිබඳව තොරතුරු හමු වේ.

අනුරාධපුර යුගයේ මුල් භාගයේ දී අභියාචනා නඩු හා නිලධාරීන් පිළිබඳව නඩු පමණක් නොව කෙළින් ම තමා වෙත ඉදිරිපත් කරන ලද සුළු නඩු පවා රජු විසින් විසඳන ලද බවත්, එකල ප්‍රාදේශීය විනිශ්චයකරුවන් කටයුතු කරන ලද බවත් පැහැදිලිව හඳුනාගත හැකි විය. රජුගේ කටයුතු සංකීර්ණ වීම හේතුකොට ගෙන අධිකරණ පාලන ක්‍රමය ද පුළුල් පරාසයක විහිදී ගොස් ඒ හරහා විවිධ තනතුරු දරූ නිලධාරී පැලැන්තියක් බිහි වූ බව හඳුනාගත හැකි ය. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ සිට රජුට පැවරී තිබූ නොයෙක් පරිපාලන කටයුතු අධික වීම නිසා රජු තමාගේ අධිකරණ බලතලවලින් කොටසක් විනිශ්චය අමාත්‍යයෙකුට පවරා ඔහු ප්‍රාදේශීය විනිශ්චයකරුවන්ගේ නායකයා වශයෙන් පත්කරන්නට ඇතැයි මේ අනුව අපට සිතාගත හැකි ය. අභිලේඛන සාක්ෂි හා සාහිත්‍ය මූලාශ්‍රය සන්සන්දනාත්මකව විමසන විට රාජ්‍ය සංවිධානය බිහිවීමෙන් පසු පාලන යාන්ත්‍රණය පාලකයාගේ මූලිකත්වයෙන් හා පාලක මණ්ඩලයක සහයෙන් ක්‍රමවත්ව ක්‍රියාත්මක වීම සඳහා ප්‍රාදේශීය පාලනය ද ක්‍රමවත්ව පැවැතිය යුතු විය. ඒ සඳහා යහපත්, කාර්යක්ෂම අධිකරණ ක්‍රියාවලියක් රජරට රාජධානියේ ක්‍රියාත්මක වූයේ යහපාලන ලක්ෂණ විද්‍යාමාන කරමිනි.

**4.5 ප්‍රාදේශීය පාලනය හා යහපාලනය**

දියුණු යහ පාලන සංවිධානයක විශේෂ ලක්ෂණයක් ලෙස ක්‍රමවත් ප්‍රාදේශීය පරිපාලනය දැක්විය හැකි ය. අනුරාධපුර රාජධානියේ ඉතිහාසයෙහි ආරම්භයේ සිට ම ශ්‍රී ලංකාව රජරට

හා රෝහණ දේශය යනුවෙන් ප්‍රධාන ප්‍රදේශ දෙකකට බෙදී තිබිණි. රාජ්‍යයකට අයත් විශාල ප්‍රදේශ පස්ස, දේස, ජනපද, ආදී නම්වලින් හැඳින්වීම ක්‍රි. ව. 7 වන සියවස පමණ වන තෙක් පැවතී ඇත. ප්‍රදේශ නායකයෝ ''රටික'', ''රටිය'' යන නම්වලින් හඳුන්වා ඇති බව ක්‍රි. ව. මුල් සියවස්වලට අයත් ශිලා ලිපිවලින් පැහැදිලි වේ. ඔවුන් අතරින් එක් අයෙකු පාලනය කළ උපකොට්ඨාසයක් "රාජි", "බීජ" සහ "අතන" යන නම්වලින් හඳුන්වා තිබේ.

පාලන පහසුව සඳහා අනුරාධපුර රාජ්‍යය එහි සිවු දිසාවට විහිදී ගිය ප්‍රධාන පළාත් හතරකට බෙදා තිබුණි. උත්තර පස්ස, පැළපස, පාචීනදේස, දක්ඛිණ දේශ යනු එම පළාත් හතරයි. මෙම පළාත් පාලනය සඳහා ඈපා හෙවත් ආදිපාද යන කුමාරවරු හෝ ඇමතිවරු පත් කරනු ලැබූහ. වළගම්බා රජුගේ කාලයේ දී දකුණු පස පාලකයා වූයේ සංඝ නම් ඇමතියෙකි (බුද්ධදත්ත, 1959b: 176). වසභ රජුගේ පාලන සමයේ දී උත්තර පස්සයේ නාගදීපය පාලනය කරනු ලැබුවේ ඉසිගිරිය නම් අමාත්‍යවරයෙකු විසින් බව වල්ලිපුරම් රන් සන්නසෙහි සඳහන් වේ (Paranavitana, 1970). නමුත් අනුරාධපුර යුගයේ දී මේ සියලු ප්‍රදේශ පාලනය කරනු ලැබූයේ රාජ කුමාරවරුන් විසින් පමණක් බව සිලාකාල රාජ්‍ය (ක්‍රි. ව. 522-535) කාලය පිළිබඳව පරීක්ෂා කර බැලීමෙන් තහවුරු වේ.

''මලමඬුලු'' යනුවෙන් රටේ පැවති තරමක් විශාල වූ ප්‍රාදේශීය පරිපාලන ඒකක හඳුන්වා තිබේ. මෙම ප්‍රාදේශිය පාලන ඒකක පොළොන්නරු යුගයට අයත් අමාවතුරෙහි හා ධර්මප්‍රදීපිකාවේ ද පිළිවෙළින් ගම්, නියම්ගම්, නුවර, දනව් හා මලමඬුලු යන්නෙන් හා ගම්, නියම්ගම්, දනවු හා මලමඬුලු යන්නෙන් සඳහන් වී තිබීම මෙයට නිදසුනකි (බුද්ධදත්ත, 1958; 50).

අනුරාධපුර යුගයේ දී රජ පවුලේ ම කෙනෙකු වූ උපරජු බොහෝ විට දක්ඛිණ දේශය හෝ රෝහණය හෝ පාලනය කළේ ය. එබඳු කෙනෙකු නැති විට ''රෝහණ බොජක'' නම් ඇමතියෙකු විසින් රෝහණ ප්‍රදේශය පාලනය කරන ලදී. පරණවිතානයන්ට (1970) අනුව යුවරජු ප්‍රාදේශික රෝහණය පාලනය නොකොට එය, අමාත්‍යවරුන් මාර්ගයෙන් පාලනය කරනු ලැබ ඇති බව සඳහන් වේ. තිස්සමහාරාමයෙන් ලද පළමුවන සියවසට අයත් ටැම් ලිපියක භාතික අභය රජුගේ පුත්‍රයෙකු වූ ද, රෝහණික (රුහුණු පාලක) යන තිල නාමය දරුවා වූ ද ගාමිණි අභය නම් කුමරකු ගැන සඳහන්ව ඇති අතර එහි එම කාලයට අයත් ටැම්ලිපියක ''මහගමහි'' යනුවෙන් හඳුන්වනු ලැබූ "බදව" ඇමතියෙකු පිළිබඳ සඳහන්ව ඇත (Paranavitana, 1970). හුරුළු පළාතේ කොක්එබ නම් ස්ථානයෙන් ලැබී ඇති දෙවන භාතිකාතිස්ස රජුගේ පර්වත ලිපියක එකල මහගම හෙවත් රුහුණු රට පාලනය කළ සංඝ නම් (මහගම බොජිය අය සගස) ආදිපාදයකු පිළිබඳව සඳහන් වේ (Paranavitana, 1970). මෙහි දී හඳුනාගත් තොරතුරු වලට අනුව ඇමතිවරු හා කුමාරවරු ද උපරජු වෙනුවෙන් පාලනය මෙහෙයවා ඇති බව අනාවරණය වේ.

රාස්සහෙල නම් ස්ථානයෙන් ලැබී ඇති අටවන සියවසට අයත් සෙල්ලිපියක "සරට්වග" යන ප්‍රදේශ නාමය භාවිත කර ඇත (Paranavitana, 1944). වග්ග හෙවත් වග යනු කුඩා පරිපාලන ඒකක හැඳින්වීමට භාවිත වූ පදයකි. ගලපාත විහාර පර්වත ලිපියෙහි බෙන්තර නමින් හඳුන්වා ඇති ප්‍රදේශය පස්යොදුන් වග යනුවෙන් එකල හඳුන්වා ඇත. පංචයෝජන රට්ඨ පස්යොදුන් රට ලෙස චූලවංශය මෙය හැඳින්වීම සඳහා භාවිත කර තිබේ (Paranavitana, 1944). මේ අනුව වග්ග යනු රට්ඨ නම් වූ පරිපාලන ඒකකය හැඳින්වීමට යොදාගත් වෙනත් නාමයක් බව පැහැදිලි ය. ප්‍රාදේශීය පරිපාලන ඒකක අතර කණිය, රාජි

යන සංඥානාම පිළිබඳව සඳහන් වන අතර ඒවා පිළිබඳ නිවැරදි ආකාරයට තක්සේරුවක් ඉදිරිපත් කිරීමේ හැකියාව නො පවතී. ප්‍රාදේශීය පාලනයේ කුඩා ම ඒකකය ගම ලෙස හඳුනාගත හැකි අතර, ගමට වඩා තරමක් විශාල වූ පරිපාලන ඒකකය ද පැවත තිබේ. තෝනිගල, ලබුඇටබැඳිගල සෙල්ලිපිවල හා ධම්පියා අටුවා ගැටපදයේ මෙන් ම ධම්මපදට්ඨකථාවෙහි "නිගම" හා "නියම්ගම්" යන පදය පරිපාලන ඒකකයක් වශයෙන් හඳුන්වා තිබේ (Wickramasingha, 1933). ඇතැම් මූලාශ්‍රයයන්හි "නිගම" යන්න කුඩා නගරයකට ව්‍යවහාර වන තවත් නමක් ලෙස අර්ථ දක්වා ඇත. පරණවිතානයන්ට (1970) අනුව මෙහි අර්ථය වෙළෙඳ නගරය හෝ වෙළෙඳ ශ්‍රේණිය බව අදහස් කර තිබේ. පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය නම් කෘතියේ දී පෙන්වා දෙන පරිදි නිගම වූකලී පවුරකින් ආරක්ෂිත වෙළෙඳ පොළකට හෝ වෙළෙඳුන් සිටි ජනාවාසයකට හෝ ව්‍යවහාර වූ නමක් බව සඳහන් වේ (එල්ලාවල, 2002: 98).

අනුරාධපුර යුගයේ පැවති ප්‍රාදේශීය පරිපාලනයේ කුඩාම ඒකකය "ගම" ලෙස මූලාශ්‍රය තොරතුරු අනුව හඳුනා ගත හැකි ය. ක්‍රි. පූ. සියවස්වල "ගමික" වශයෙන් හැඳින්වුණු ගම්පති නිලය අනුරාධපුර රාජධානියේ පසු භාගය වන විට "ගම්ලද්දා" යන පදයෙන් හඳුන්වා ඇති බව ශිලා ලිපිවලින් හෙළි වෙයි. ස්වකීය ප්‍රදේශයේ ආදායම් පාලනය, අධිකරණ සමථය ආදී සෑම කටයුත්තකදී ම මෙම නිලධාරීන් වගකිව යුතු විය.

මේ සාක්ෂි විභාග කර බලන විට රාජ්‍ය සංවිධානය බිහි වීමෙන් පසු පරිපාලන රටාව ගම් මට්ටම දක්වා ගෙනයෑම සඳහා විධිමත් ක්‍රමයක් පැවැතිණැයි යන්න සඳහන් කළ හැකි ය. එමෙන් ම ප්‍රාදේශීය පාලන රටාව එක ම ස්වරූපයකට පැවති බවක් නො පෙනේ. එසේ වුව ද පාලකයන්ගේ දක්ෂතාව මත අනුරාධපුරය මුල් කරගෙන පැතිරුණු පාලන රටාවේ ක්‍රමවත් බවක් රඳා පැවති බව පැහැදිලි වේ.

### 4.6 යහපාලනය සඳහා බලපාන ලද කරුණු

ජනතාවගේ කටයුතු ක්‍රමවත්ව හා විධිමත්ව ඉටුකර ගැනීමත්, නීතිය හා යුක්තිය සාධාරණව ගෙනයෑමත්, ජන ආරක්ෂාවත් රාජ්‍යය පාලකයකුගෙන් මෙන් ම පරිපාලන සංවිධානයකින් ජනතාව අපේක්ෂා කරන ලදි. මේ තත්ත්වයන් මඟින් යහ පාලනයකට රාජ්‍යය පාලකයන්ට අවකාශ හිමිවන අතර පාලකයා මහජනතාව සමඟ සමීපව කටයුතු කිරීමේ අවකාශය ද හිමි වෙයි. රාජ්‍යය බලයෙන් උද්දාමයට පත්ව කටයුතු කිරීම මඟින්, ස්වකීය රාජ්‍ය උරුමය ගිලිහී යාමට ඇති අවස්ථා සුලභ වේ. රටේ රජතුමා යුක්ති ධර්මයේ උල්පත බව මහජනතාවගේ පිළිගැනීම වී තිබුණු බව මූලාශ්‍රයගත සාධක තුළින් සනාථ වේ.

වංශ කථාවේ මෙන් ම අනුරාධපුර යුගයේ ඇතැම් සෙල්ලිපි මූලාශ්‍රයවලට අනුව රජුට පැවරුණු ප්‍රධාන කාර්යය වී තිබුණේ ලෝසසුන් වැඩීම හෙවත් මහජනයා හා බෞද්ධාගම ආරක්ෂා කිරීම යි. එනම්, ඔහුගේ යටත් වැසියන් හා බුදු සසුන රටේ අභ්‍යන්තරයේ සතුරන්ගෙන් මෙන් ම පරසතුරන්ගෙන් ද ආරක්ෂා කර ගැනීම යි. වැසියන්ගේ පොදු අවශ්‍යතා මෙන් ම ඔවුන්ගේ යහපත සැලසීම පාලකයාගෙන් ඉටුවිය යුතු කාර්යයේ කොටසක් වූ අතර එය නිසි පරිදි ක්‍රියාවේ ද යෙදවිය යුතු ය. විදේශීය ආක්‍රමණිකයන් පරසතුරන් ලෙස සැලකුණ අතර ඔවුන්ගෙන් තම රට වැසියා ආරක්ෂා කරගත යුතු විය. පරසතුරු ආක්‍රමණිකයන්ට හා අභ්‍යන්තර කැරලි කෝලාහලවලට මුහුණ දීම සඳහා යුද හමුදා සංවිධාන ඇති කොට පවත්වාගෙන යා යුතු අතර ඇතැම් විට පාලකයා ද යුද බිමට බැස පෙරමුණ ගෙන ක්‍රියා කිරීම තුළ මහජන ප්‍රසාදය පාලකයාට හිමිව තිබිණි.

රජුගේ බලය කිසිදු ව්‍යවස්ථාවකින් සීමා නොවන අතර රජු පරමාධිපති බලයක් සතු වූවකු බව සිද්ධාන්තයක් වශයෙන් පිළිගැනුණ ද ක්‍රියාත්මක වශයෙන් එය බොහෝ දුරට සීමා වූයේ සිරිත් විරිත් මඟින් රජුගේ බලය එක්තරා ප්‍රමාණයකට සීමා වීම නිසා බව හඳුනාගත හැකි ය. රජුගේ චරිත ස්වභාවය රාජ්‍ය පාලනයේ දී ප්‍රමුඛ සාධකයක් ව බලපැවැත්වෙන අතර පූර්ව රජවරුන් විසින් ස්ථාපිත කෙරුණු ආකාරයට යුක්තිය, ආචාර ධර්ම හා පෙර සිරිත් වැනි සාධාරණත්වයේ මූලික ප්‍රතිපත්ති රජු විසින් අනුගමනය කළ යුතුය යන මහජන මතය ද දැඩි සේ ඒ සඳහා බලපා තිබුණි. පෙර සිරිත් නොසලකා හැරි හෝ මහාසංඝයා අමනාප කරගත් හෝ රජෙකු වී නම්, ඔහු තම යටත් වැසියන් වෙතින් ලබා තිබූ දයාව හා කරුණාව අහිමිකර ගත්තකු බවට පත්වෙයි. සිවුවන මිහිඳු රජුගේ ජේතවනාරාම පුවරු ලිපි අංක දෙකෙහි සඳහන් ප්‍රකාශය මෙහි දී වැදගත් වේ (Wickraasingha, 1912). ඒ අනුව මහාසංඝයාගේ අවවාද අනුශාසනාවන් හා නියමයන්ට ඇහුම්කන් දී රාජ්‍යය පාලනය කිරීම යහපත් බව සඳහන් වේ.

ආර්ථිකමය වශයෙන් කෘෂිකර්මාන්තය නගා සිටුවීමටත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමටත් කටයුතු කළ යුතු අතර දුර්භීක්ෂයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම මෙමඟින් සැලසේ. ලෙඩරෝග හා වසංගත පිටුදැකීම පිණිස මිනිසුන් සඳහා මෙන් ම තිරිසන් සතුන් සඳහා ද රෝහල් ඉදිකොට ඒවා පවත්වාගෙන යාම වෙනුවෙන් අවශ්‍ය වෙදුන් හා හෙදියන් පත් කළ බව වංශකථාවන්හි සඳහන් වේ. රටක් ස්වභාවික උවදුරවලින් තොර විය යුතු අතර එමඟින් ජනතාවගේ ඒකාත්මික ස්වභාවය ආරක්ෂා වනු ඇත. ස්වාභාවික උවදුරු මඟින් ජනතාව විශාල වශයෙන් නොසන්සුන්තාවට පත්වන අතර එවන් අවස්ථාවන්හි දී පාලකයා ජනතාවගේ සනීපාරක්ෂාව පිළිබඳ ව සොයාබලා කටයුතු කිරීම තුළ, පාලක-පාලිත විශ්වාසය තවදුරටත් ආරක්ෂා වේ. රටේ අධිකරණ කටයුතු මනාව පවත්වාගෙන යාම රජුගෙන් ඉටුවිය යුතු කාර්යයක් වූ අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පාලකයකු විසින් සිදුකළ යුතු විය. ආගමික කටයුතු කෙරෙහි හා ආගමික ස්ථාන දියුණු කිරීම මෙන් ම භික්ෂූන් අතර පවත්නා මනා සබැඳියාව මඟින් සමාජයේ දියුණුව ඇති වී රාජ්‍ය පැවැත්ම වර්ධනය වීම සිදුවන අතර එය වක්‍රාකාරව රජුගේ චරිත ස්වභාවය වර්ධනයට හේතු වූ බව කිව හැකි ය.

මේ අනුව ආරම්භයේ සිට දිවයිනේ ඉතිහාසය පිළිබඳව මූලාශ්‍රයගත කරුණු හා අභිලේඛන සාක්ෂි පිළිබඳව අවධානය යොමු කිරීමේ සී රාජ්‍ය පාලනයේ ස්වභාවය, පාලන බලයට පත් පාලකයින්ගේ ප්‍රතිපත්තීන් තුළින් විද්‍යමාන වී ඇත්තේ යහපාලන ව්‍යුහයකි.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ අතීත රාජ්‍ය පාලනයේ දී මෙරට පාලකයින් ඒකාධිපති ස්වරූපයකට වඩා මනුෂ්‍ය ප්‍රජාවේ ආරක්ෂකයින් ලෙස ක්‍රියාකිරීම පිළිබඳව බොහෝ මූලාශ්‍රය සාක්ෂි අනුව කරුණු තහවුරු වේ. ශ්‍රී ලංකාවේ රජ තනතුරු ක්‍රමිකව විකාශනය වීමේ දී රජවරුන්ට ජනතාවගේ ජීවිත සුඛිත, මුදිත කිරීමට වගකීම් පැවරෙන අන්දම මෙම අධ්‍යයනයේ දී මූලිකව සාකච්ඡා කරන ලදි. එමෙන් ම රජු තමා වටා කේන්ද්‍රගත වූ බලය උපයෝගී කරගෙන සාධාරණ හා යුක්තිසහගතව නීති ක්‍රියාත්මක කළ බවත්, එම නිසා "රජු නීතියේ හා යුක්තියේ උල්පත" ලෙස මෙරට ජනතාව සැලකූ බවත් පැහැදිලි විය. මහජන සුභසාධනය තම වගකීමක් ලෙස රජවරු සැලකූ බවත්, එසේ සුභසාධනයේ නිරත වූ රජවරු දේවත්වයෙන් ජනතාව සැලකූ බවත් පැහැදිලිව හඳුනාගත හැකි ය. අතීත රජවරුන්ගේ චරිත ස්වභාවය මත රටවැසියන්ට කාරුණික වීම, ඇහුම්කන්දීම, සාධාරණව නීතිය

ක්‍රියාත්මක කිරීම, ජාතික අර්බුදවලදී ජනතාව වෙනුවෙන් කටයුතු කිරීම වැනි ලක්ෂණ මගින් අතීත යහපාලනයට පදනම සකස් වූ බව මෙම අධ්‍යයනයේ දී පැහැදිලි විය. අතීතයේ දී මෙරට ජනතාවගේ පාලන කටයුතු පහසු වීම සඳහා රජවරුන් විසින් පරිපාලන ධුරාවලියක්, ප්‍රාදේශීය පරිපාලන රටාවක් හා අධිකරණ ක්‍රමයක් සකස් කර තිබුණි. මේ අන්දමින් බෙදා දෙන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී එක් එක් නිලධාරීන්ගේ කටයුතු අධීක්ෂණයට ද ක්‍රමවේදයක් සකස් කොට නිලධාරීන්ගේ පාලනයේ දුර්වලකම්වලට ප්‍රතිකර්ම ද අතීතයේ යොදා තිබූ බව නිරීක්ෂණය විය. මධ්‍යගත බල කේන්ද්‍රයේ නායකයා ලෙස රජු මහජනතාව වෙනුවෙන් අවසාන බලධාරියා ලෙස ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ ක්‍රියාවලට අනුව කටයුතු කර ඇත්තේ, රාජ නීතිය, පෙර සිරිත්, රජාඥාවලට එකඟව ය. එම නිසා යහපාලනයක පැවතිය යුතු අංග වන සාධාරණ බව, යුක්තිසහගත බව, මෙන් ම සමාන ලෙස සැලකීම අතීත පාලන රටාවේ දැකිය හැකි විය. පරිපාලන රටාව ධූරාවලිගත කොට මහජනතාවගේ ප්‍රවේශය සඳහා පහසුකම් සලසා තිබූ අතර ම සිදු වන අසාධාරණවලින් ජනතාව ආරක්ෂා කිරීමට ද අතීතයේ දී ක්‍රමවේද පැවති බවත්, එය යහ පාලන මූලධර්මවලට එකඟ බවත් මෙහි දී පැහැදිලි විය. රජු විසින් මහජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමට ගත් පියවර, සාධාරණ විනිශ්චය සඳහා යෙදූ උපාය මාර්ග, සුභසාධනය සඳහා යොදන ලද උපාය මාර්ග ආදී බොහෝ ක්ෂේත්‍ර මගින් ශ්‍රී ලංකාවේ අතීත යහපාලන ප්‍රතිපත්ති මැනවින් විශද වේ.

**පරිශීලන නාමාවලිය**

එල්ලාවල, එච්. (2002). *පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය.* කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ජයතිලක, ඩී. බී. (සංස්.), (1943). *ජාතක අටුවා ගැටපදය.* කොළඹ: ලංකාභිනව විශ්‍රෑත මුද්‍රණාලය.

ඤාණවිමල, කිරිඇල්ලේ. (සංස්.), (1929). *පන්සියපනස් ජාතක පොත.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ඤාණවිමල, කිරිඇල්ලේ. (සංස්.), (1959). *දීපවංශය.* කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ඤාණවිමල, කිරිඇල්ලේ. (සංස්.), (2004). *සද්ධර්ම රත්නාවලිය.* කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධර්මකීර්ති, යූ. එස්. (සංස්.), (1990). *සමන්තපාසාදිකා.* කොළඹ: ග්‍රන්ථාවලෝක මුද්‍රණාලය.

ධර්මාරාම, රත්මලානේ. (සංස්.), (1921). *එළු අත්තනගලුවංසය.* කොළඹ: ග්‍රන්ථාවලෝක මුද්‍රණාලය.

බුද්ධදත්ත, පොල්වත්තේ. (සංස්.), (1958). *අමාවතුර.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

බුද්ධදත්ත, පොල්වත්තේ. (සංස්.), (1959a). *ඌණපූර්ණ සහිතෝ මහාවංසෝ,* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

බුද්ධදත්ත, පොල්වත්තේ. (සංස්.), (1959b). *සහස්සවත්ථුප්පකරණය.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

බුද්ධදත්ත, පොල්වත්තේ. (සංස්.), (1996). *මහාවංස ප්‍රථම භාගය.* කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

වාච්චගේ, එස්. (2001). *සිරිමල් රණවැල්ල උපහාර ලිපි සංග්‍රහය.* කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය. (1964). *ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය.* 1 කාණ්ඩය, (අනුරාධපුර යුගය), කැලණිය: විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය.

විමලබුද්ධි, බලගල්ලේ. (සංස්.), (1966). *සිංහල ථූප වංශය.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ශ්‍රී සුමංගල, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ. (සංස්.), (1931). *මහාවංසය.* සංස්කරණය, හා , කොළඹ.

සද්ධාතිස්ස, බෙන්තර. (සංස්.), (1934). *සද්ධර්මලංකාරය.* පානදුර: ආසිරි ප්‍රකාශන.

සේනාධීර, ගුණපාල. (සංස්.), (1970). *සිංහල බෝධි වංශය.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2004). *ශ්‍රී ලාංකේය ඉතිහාස තරංග.* වරකපොළ: ආරිය ප්‍රකාශකයෝ.

Hettiarachchy, T. (1972). *History of Kingship in Ceylon up to the fourth century*. A. D, Colombo: Lake House Investment LTD.

Paranavitana, S. (1944). *Epigraphia Zeylanica*. Vol. iv, Colombo: Department of Archiology.

Paranavithana, S. (1970). *Inscriptions of Ceylon*. Vol. I, Edited, Colombo: Department of Archaeloghy.

Paranavithana, S. (1983). Inscriptions of Ceylon, Vol. II, Part I, Edited, Colombo: Department of Archaeloghy.

Wickraamasingha, D. M. De Silva. (1912). *Epigraphia Zeylanica*. Vol. I, Edited, London: Oxford University Press.

Wickraamasingha, D. M. De Silva. (1928). *Epigraphia Zeylanica.* Vol. II Edited, London: Oxford University Press.